# දකුණු පළාත් සභාව

**අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහාමාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය**

## දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

## තනතුරු ඇබෑර්තු

**01. සේවා ගණය - ආශ්‍රිත නිලධාරී - (MA - 3)**

1:1 **සේවා ගණය තුළ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව -**

**වැඩසටහන් සහකාර තනතුරු - 02**

1:2 **වැටුප් ක්‍රමය** - (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2016 පරිදි)
32,200 - 10X445 - 11X660 - 10X730 - 5X750 - 54,960/-

1:3 **වයස** - අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. 22-45 අතර විය යුතුය.

1:4 **බඳවාගැනීමට අවශ්‍ය සුදුසුකම් -**

1:4.1 **අධ්‍යාපන සුදුසුකම් -**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය / ආර්ථික විද්‍යාව / සංඛ්‍යානය / වාණිජ විද්‍යාව / ගණිතය / විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

**02. සේවා ගණය - කළමනාකරණ සහකාර - (තාක්ෂණික නොවන) (MA 1-2)**

2:1 **සේවා ගණය තුළ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව -**

**කළමනාකරණ සහකාර - (තාක්ෂණික නොවන) - තනතුරු - 15**

2:2 **වැටුප් ක්‍රමය** - (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 02/2016 පරිදි)
27,910 - 10X300 - 7X350 - 12X600 - 12X710 - 49,080/-

2:3 **වයස** - අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. 18-45 අතර විය යුතුය.

2:4 **බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් -**

2:4.1 **අධ්‍යාපන සුදුසුකම් -**

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

I. සිංහල / දෙමළ

II. ගණිතය

යන විෂයන් ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව සහ ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම්.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක පරිගණක සාක්ෂරතාවය පිළිබඳ පහත සඳහන් විෂය සංරචකයන්ගෙන් සමන්විත මාස හයක (06) කට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

1. පරිගණක භාවිතයෙන් සම්මත මෙහෙයුම් පද්ධති යටතේ ලිපිගොනු කළමනාකරණය.
2. පරිගණක වදන් සැකසුම.
3. පැතුරුම් පත් සකස් කිරීම හා භාවිත කිරීම.
4. පරිගණකය භාවිතයෙන් ඉදිරිපත් කිරීම.
5. දත්ත සමුදාය නිර්මාණය හා භාවිතය.
6. අන්තර්ජාලය සහ ඉලෙක්ට්‍රොනික තැපැල භාවිත කිරීම.

❖ **සේවා කොන්දේසි :**

I. බඳවා ගැනීම කරනු ලබන්නේ ස්ථිර තනතුරක් සඳහා වේ.

II. බඳවාගනු ලබන අය සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදලේ සාමාජිකත්වය ලැබිය යුතුය.

III. තෝරාගැනීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

IV. රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලයක ස්ථිර තනතුරු දරන්නන් සඳහා උපරිම වයස් සීමාව ගණන් ගනු නොලැබේ.

❖ **සෑම ඉල්ලුම්කරුවෙක්ම,**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

සියලු විස්තර ඇතුළත් ජීව දත්ත සටහන්, අධ්‍යාපනික සහතික සහ අතිකුත් සුදුසුකම් සහිත සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් ද සමග 2020.09.29 දිනට පෙර **"සාමාන්‍යාධිකාරී, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 19, පහළ ඩික්සන් පාර, ගාල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

❖ අයදුම්පත් එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ ඉල්ලුම් කරන තනතුර සඳහන් කොට එවිය යුතුය.

❖ දකුණු පළාතේ ස්ථිර පදිංචිකරුවන් පමණක් මේ සඳහා අයදුම් කළ යුතුය.

**සාමාන්‍යාධිකාරී, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.**

**2020.09.08**